# සමාජානුයෝජනය පිළිබඳ බෞද්ධ සංකල්පය

වරදිවෙල විජයසුමන හිමි

## හැඳින්වීම

සමාජානුයෝජනය යනු පුළුල් වූ ක්‍රියාවලියකි. මිනිස් සමාජය නැමැති මානව සම්බන්ධතා ජාලය නිර්මාණය කිරීමට අවශ්‍ය සමාජීය සත්ත්වයා නිර්මාණය කිරීම මෙහි ප්‍රධාන කාර්යය වේ. ඒ අනුව ජෛවීය සත්ත්වයෙකු වන මිනිස් දරුවා සමාජයීය සත්ත්වයෙකු බවට පත්කරලීමේ ක්‍රියාවලිය සමාජානුයෝජනය ලෙස සමාජ විද්‍යාඥයෝ අර්ථ දක්වති (Chinoy, Ely, 1962: P. 334.). මිනිස් සංහතියේ ආරම්භයෙහි පටන් ම මිනිසා සඳහා සමාජ හුරුව ලබාදෙන ක්‍රියාවලියක් පැවතිතැ'යි සිතීම යුක්ති යුක්ත ය. මිනිස් දරුවා සිය උපතේ සිට ම තමා අවට සිදුවන දෑ නිරීක්ෂණය කරයි. මෙයින් දරුවා යම් ආකාරයක හැඩ ගැසීමක් හෝ හුරුවක් ලබා ගනියි. අනතුරු ව ඔහු සිය මවගේ ඇසුරින් හෝ පවුලේ සෙසු සාමාජිකයන්ගෙන් ආහාර පිළිබඳ සිරිත්, ඇඳුම් පැළඳුම් භාවිතය, වැසිකිළි සිරිත් වැනි පිළිවෙත්හි, හුරුවක් ලබාගනියි. මෙම හැඩගැසීමේ ක්‍රියාවලිය තුළ පිළිබිඹු වන්නේ සමාජානුයෝජනමය අගයකින් යුත් ප්‍රාථමික පිළිවෙත් සමූහයකි. ශාරීරික වර්ධනයත් සමග ම, ඔහු තම පවුලේ පරිසරයෙන් ඔබ්බට ගොස්, පුළුල් සමාජ පරිසරය වෙත යොමු වේ. එහිදී තමා අයත් සමාජයේ ස්වභාවය හඳුනාගැනීමට ඔහුට හැකියාව සැලසේ. එම හඳුනාගැනීමේ ක්‍රියාවලිය ද්විතීයික වූවකි. අධ්‍යාපනමය වටිනාකමක් සහිත එම ඉගෙනුම් ක්‍රියාවලිය සඳහා මිත්‍ර කණ්ඩායම්, අධ්‍යාපනය, ආගම, වෘත්තීය ක්ෂේත්‍ර ආදී සමාජ සංස්ථාවන්ගේ සහාය ලැබේ. ඒ ආශ්‍රිත ව තමා අයත් සමාජයට අදාළ ලෙස හැඩගැසීම හෙවත් අනුයෝජනය වීම සිදු වේ. එම අධ්‍යාපනමය ක්‍රියාවලිය සමාජානුයෝජන ලෙස පුළුල් ව විවරණය වේ. එකී සමාජානුයෝජනය ක්‍රියාවලිය මුල්බුදුසමයෙහි පිළිබිඹු වන ආකාරය විමර්ශනය කිරීම මෙහි අරමුණ වේ.

**විශ්වීය පර්යායන් හා සමාජානුයෝජනය**

සර්ව විශ්වීය දෘෂ්ටියකින් ලෝකය පිළිබඳ ව අවධානය යොමුකිරීමේදී එහි විද්‍යමාන වන පර්යායන් දෙකක් වන්නේ ස්වභාවික පර්යාය හා සංස්කෘතික පර්යාය යි (හේරත්, 2000). මෙකී ස්වභාවික පර්යාය හා සංස්කෘතික පර්යාය මිනිසාගේ ස්වභාවය, ක්‍රියාකාරකම් මෙන් ම ඔහු සතු සුවිශේෂී ස්වභාවය වඩාත් හොඳින් හඳුනා ගැනීමට ඉවහල් වේ.

**ස්වභාවික පර්යාය** (Natural Order)

මිනිසුන් නොවන සත්ත්වයන් හා ඔවුන්ගේ ජීවන ක්‍රමයට අදාළ වූ ස්වභාව ධර්මය ස්වභාවික පර්යායට අයත් වේ. එම සත්ත්වයන් හා ශාක ලෝකය ස්වභාවික පර්යායෙහි අන්තර්ගත වේ. ස්වභාවික පර්යායට අයත්වන සත්ත්වයෝ සිය පැවැත්ම සඳහා ස්වභාව ධර්මය උපයෝගී කරගනිති. ඔවුහු ආහාර වශයෙන් සිය පර්යායට අයත් සත්ත්ව වර්ගයා ගොදුරු කර ගනිති. නැතහොත් ශාක ලෝකයට අයත් පළතුරු, අල වර්ග, තෘණ වර්ග ආහාරයට ගනිති. ඔවුනට නිෂ්පාදන කාර්යයට අදාළ ශ්‍රමය, භූමිය වැනි සාධක පිළිබඳ ව අවධානයක් නොමැත. සත්ත්වයෙකුගේ ආහාරය තීරණය කරනු ලබන්නේ ස්වභාව ධර්මය මගිනි. සහජය පෙරදැරිව කටයුතු කරන සත්ත්වයා සිය ආහාරය සඳහා අන් සත්ත්වයෙකු ගොදුරු කොට ගනියි. මෙම ආහාර දාමය ස්වභාව ධර්මයේ ම අංගයකි (හේරත්, 2000).

**සංස්කෘතික පර්යාය** (Cultural Order)

සංස්කෘතික පර්යාය මිනිස් නිර්මාණයකි. ස්වභාවික පර්යාය ඉක්මවා යාමක් එයින් ප්‍රකට වේ. ස්වභාව ධර්මය තුළ සිරවී සිටීමට අකැමැති මිනිසා සිය ක්‍රියාකාරකම් ඉන් ඔබ්බට විහිදුවයි. වෙනත් ලෙසකින් කිවහොත් සිය ප්‍රවේණියෙන් ලද උරුමයන් ද ඉක්මවා යමින් සංස්කෘතික පර්යාය නිර්මාණය කරගනියි (හේරත්, 2001).

ස්වභාවික පර්යායයේ සිට සංස්කෘතික පර්යාය වෙත යොමුවීම සඳහා මිනිසා සතුව පවත්නා ජීව විද්‍යාත්මක ලක්ෂණ වාසිදායක

ලෙස බලපායි (පෙරේරා, 2002). මිනිස් දරුවා ශාරීරික වර්ධනයත් සමග ම දෙපයින් නැගී සිටීමේ හැකියාව ලබයි. එවිට ඔහුට සිය ඉදිරි දෑත් නිදහසේ හැසිරවීමට පිළිවනි. යමක් ග්‍රහණය කරගැනීම හා නිරීක්ෂණය වැනි දෑ සඳහා ද ඔහුට පහසුව සැලසේ. මිනිසාගේ කායික පූර්ණත්වය සමාජ සම්බන්ධතා පහසුවෙන් පවත්වාගෙන යාමට ඉවහල් වේ. එවිට සංස්කෘතික පර්යාය ද පවත්වාගෙන යාම පහසු වේ. මිනිසා ස්වභාවයෙන් ම සමූහ වාසය ප්‍රිය කරන්නෙකි. කායික සමබරතාව පවත්වාගැනීම සාමූහික ජීවිතය සඳහා ඉවහල් වන සාධකයකි. ඒ අනුව දෙපයින් සිට ගැනීමේ හැකියාව චර්යා පවත්වාගෙන යාමේ දී අවශ්‍ය ශක්තිය ලබාදෙයි. මිනිසාගේ හස්තයේ ඇඟිලි නිර්මාණය වී ඇති ආකාරය ද ජීවිතය පහසුවෙන් පවත්වාගෙන යාමට උදව් වේ. විශේෂයෙන් මහපට ඇඟිල්ලෙහි ව්‍යුහය ඒ සඳහා උපකාරී වේ. යමක් පහසුවෙන් අල්ලා ගැනීමට මෙන් ම යම් යම් නිර්මාණ කිරීම සඳහා ද මහපට ඇඟිල්ලෙහි ව්‍යුහය ප්‍රබල සාධකයකි.

මිනිසා සතු සන්නිවේදන හැකියාව ද සංස්කෘතික පර්යාය ප්‍රබලත්වයට පත් කරවන සාධකයක් වේ. ශබ්ද නගා උච්චාරණය කිරීමට හැකිවන ලෙසින් ඔහුගේ දිව හා හකු නිර්මාණය වී ඇත. භාෂාව ආශ්‍රිත වචන භාවිතයෙන් අදහස් ගොඩනැගේ. ආවේණික මිනිස් ගුණාංගයක් වන, සමූහශීලී ස්වභාවය ස්ථාවර කරවන ප්‍රධානතම ලක්ෂණය වන්නේ ද භාෂා භාවිත කුසලතාව යි. මිනිසා තිරිසන් සතුන්ගෙන් වෙනස් වූවකු ලෙස කටයුතු කරනුයේ ද භාෂාව භාවිතයෙනි. භාෂාව මගින් අන්‍යෝන්‍ය සබඳතා ස්ථාවර කරන අතර, දැනුම පරපුරෙන් පරපුරට පවරා දෙනු ලබනුයේ හෙවත් නවක සාමාජිකයන් හැඩගස්වන සමාජානුයෝජන ක්‍රියාවලියක් පවතිනුයේ ද භාෂාවේ මහිමයෙනි (කොතලාවල, 1979). එම අදහස් සංස්කෘතික පර්යාය ස්ථාවරත්වයට පත් කරවයි.

ස්වභාවික පර්යාය ඉක්මවා සංස්කෘතික පර්යාය නිර්මාණය කරගැනීමට මිනිසා සමත් වූ ප්‍රමුඛ ජීව විද්‍යාත්මක සාධකය දියුණු මොළයක් හා විධිමත් ස්නායු පද්ධතියක් පැවතීම යි. මේ හේතුව නිසා සත්ත්ව ලෝකයේ අන් සත්ත්වයන්ට නොමැති ඉගෙනීමේ හැකියාව ඔහු සතු වේ. ප්‍රජානන ශක්තිය මිනිසා ලද විශිෂ්ට උරුමයකි. සිතා බලා කටයුතු කිරීමේ හැකියාව සංස්කෘතිය නිර්මාණය සඳහා උපස්ථම්භක

වූ බව පැහැදිලි ය. මානව චර්යා පද්ධතිය හැඩගැසෙන්නේ චින්තනය පාදක ව ය. මේ හේතුව නිසා ම සාධනීය චර්යා අනුගමනය කිරීමටත්, නිෂේධනීය චර්යා බැහැර කිරීමටත් හැකි වේ.

සංස්කෘතිය යනු ස්වභාවික සම්පත් මැඩ පැවැත්වීමටත්, ආයෝජනය කිරීමටත් අදාළ ඥාන සම්භාරය, ක්‍රියාදාමය හා කුසලතාව අඩංගු සුවිශේෂි දැනුම්, ආකල්ප, කුසලතා පද්ධතියක් ලෙස අර්ථකථනය කෙරේ (සෙනෙවිරත්න, 1971). මෙම අර්ථ නිරූපණයෙන් ප්‍රකට වනුයේ, ස්වභාවික පර්යාය ඉක්මවා සංස්කෘතික පර්යායක් ක්‍රියාත්මක වන බව යි. විශ්වයෙහි අන්තර්ගත ස්වභාව ධර්මයට අයත් සියල්ල හැරුණු විට මිනිසා විසින් නිර්මාණය කරගත් සියල්ල සංස්කෘතිය ලෙසින් සැළකේ. මිනිස් හැකියා, ඇදහිලි, විශ්වාස, සිරිත් විරිත්, කලා ශිල්ප, චර්යා ධර්ම ආදි කුඩු මහත් සමස්තය සංස්කෘතිය (Tylor, 1871) ලෙසින් අර්ථකථනය කෙරෙනුයේ මේ නිසා ය.

මිනිසා ජීව විද්‍යාමය සත්ත්වයෙකි. සිය පැවැත්ම සඳහා මිනිසාට කිසියම් ආයාසයක් දැරීමට සිදු වේ. මේ සඳහා ඔහු සරල තාක්ෂණයේ සිට ඉතා සංකීර්ණ මට්ටමේ තාක්ෂණය ද අනුගමනය කරයි. තාක්ෂණය භාවිතයෙන් භූමිය හා ශ්‍රමය ආශ්‍රිත ව නිෂ්පාදන ක්‍රියාවලියට යොමු වේ. මෙම නිෂ්පාදන ක්‍රියාවලිය විශ්ලේෂණයේ පහසුව සඳහා යුග කිහිපයකට බෙදා දැක්විය හැකිය. එම යුග ආශ්‍රිත ව මිනිසා ස්වභාවික පර්යායේ සිට සංස්කෘතික පර්යායට එක්වන අයුරු ප්‍රකට වේ.

පළමු යුගයේ දී නිෂ්පාදනය සඳහා අදාළ සාධක වශයෙන් ඔවුන් සතුව පැවතියේ ශ්‍රමය හා භූමිය පමණි. ශ්‍රමය හා භූමිය ආශ්‍රිත ව නිෂ්පාදනය සඳහා ඔවුන් භාවිත කළේ ඉතා සරල මට්ටමේ තාක්ෂණයකි. දෙවැනි අවස්ථාවේ දී ශ්‍රමය හා භූමිය එකතු කරගනිමින් පළමු යුගයට වඩා දියුණු මට්ට මේ තාක්ෂණයක් භාවිත කරන ලද බව පැහැදිලි ය. තෙවැනි යුගයේ දී නිෂ්පාදනය සඳහා ශ්‍රමය භූමිය සමග ම ප්‍රාග්ධනය ද යෙදවීම විශේෂයකි. එහි දී සාමූහික ශ්‍රමය තුළින් නිෂ්පාදනය සිදු වේ. සිවුවන යුගයේදී නිෂ්පාදන කාර්යය වඩාත් පුළුල් වේ. මේ වන විට සාමූහික කාර්යයක් වන නිෂ්පාදනය සඳහා ශ්‍රමය, භූමිය හා ප්‍රාග් ධනය මෙන් ම ව්‍යවසායකත්වය ද එක් වේ (හේරත්, 2000).

සංස්කෘතික පර්යායට එක්වීමත් සමග ම මිනිසා තිරිසන් සතුන්ගෙන් වෙන් වූවෙක් බවට පත් වේ. එම වෙන්වීමේ ක්‍රියාවලියෙහි වැදගත් අවස්ථාවක් වනුයේ පවුල් සංස්ථාවේ ආරම්භය යි. පවුල යනු මව පියා හා ඔවුන්ගේ දරුවන්ගේ එකතුවෙන් යුතු සමාජ ඒකකයකි (Bottomore, 1978). පවුල් සංස්ථාව බිහිවීමට පෙර මිනිසුන් අතර ලිංගික සබඳතා පවතින්නට ඇතැයි සිතිය හැකිය. එහෙත් එම සබඳතා තිරිසන්ගත සතුන්ගේ හැසිරීම්වලට සමාන වූවා මිස සංස්කෘතිකමය ස්වභාවයකින් යුතු ඒවා නොවූ බව ද පැහැදිලි ය (රත්නපාල, 2001). සත්ත්වයන් අතර ද ලිංගික සම්බන්ධතාවක් පවතී. එහෙත් එහි විවාහ සංස්ථාවක් නොමැත. අනියම් ලෙස මිනිසෙකු හා ගැහැණියක අතර පැවතිය හැකි ලිංගික සම්බන්ධය ද විවාහයක් ලෙස අර්ථකථනය නොවේ. මිනිසෙකු හා ගැහැණියකගේ එකතුවීම ආර්ථික හා සමාජ සම්බන්ධතා මත සිදුවන්නේ නම් එහි විවාහයක් ප්‍රකට වේ (රත්නපාල, 2001).

විවාහය සංස්කෘතිකමය සංසිද්ධියක් වන හෙයින් සමීප ඥාතීන් අතර ලිංගික සම්බන්ධතා පැවැත්වීම පිළිබඳ තහඤ්චි ද දැකගත හැකි ය. උදාහරණ වශයෙන් ලේ නෑයන් වන මව පුතා, පියා - දුව, සහෝදරයා - සහෝදරිය අතර ලිංගික සම්බන්ධතා තහංචියට ලක්වීමේ ව්‍යභිචාරීය පිළිවෙත (හේරත්, 1999) පවුල් අතර සහයෝගීතාව වර්ධනය වන සාධකයකි. සංස්කෘතියේ පැවැත්මට මිනිසුන් අතර පවත්නා අන්තර් ක්‍රියාකාරීත්වය අත්‍යවශ්‍ය වේ. සමූහයේ දියුණුව සැලසෙනුයේ මිනිසුන් එකතු වී කටයුතු කිරීම නිසා ය. ඉහත කී ව්‍යභිචාරී තහංචි ඇතිවීමට බලපෑ ප්‍රධාන හේතුවක් වනුයේ ද පවුල් අතර සිදුවන අන්තර් ක්‍රියාකාරිත්වයෙන් සිය පැවැත්මට පුළුල් සහයෝගයක් ලැබීම ය (White, 1999). විවාහ සංස්ථාවේ විකාශනයත් සමග ම ඒක භාර්යා විවාහය හා ඒක පුරුෂ විවාහය ද ප්‍රචලිත වීමෙන් ප්‍රකට වන්නේ මිනිසා සංස්කෘතිකමය සත්ත්වයෙකු බවට පත්වීමේ ක්‍රියාවලියෙහි ම විකාශනයක් බව යි. මේ අනුව ලිංගික අවශ්‍යතා ඉටුකරගැනීම සඳහා සංස්කෘතිකමය වශයෙන් තහඤ්චි පැණවීම නිසා පවුල් සංස්ථාවේ පැවැත්මට ජෛවීය සාධක මෙන්ම සංස්කෘතික සාධක ද ප්‍රබල ලෙස හේතු සාධක වන බව පැහැදිලි ය (අභයසුන්දර, 2003). එසේම ලිංගික අවශ්‍යතාව පාලනය කරනුයේ සංස්කෘතියෙහි අංගයන් වන දැනුම, බුද්ධිය, ශික්ෂණය වැනි දෑ මගිනි (Tylor, 1875). සාමූහික ව

සිදුවන අන්තර් ක්‍රියාකාරීත්වයෙන් මිනිසා සිය ජීවන රටාව ගොඩනගා ගනියි. තමා අවට පවත්නා භෞතික හා සමාජ පරිසරයන් ආශ්‍රිත ව එම ක්‍රියාවලිය නිර්මාණය කරගැනීමට ද ඔහු සමත් වේ. මෙලෙස එම පරිසරයන්හි ක්‍රියාත්මක වන, චර්යා, දැනුම, ආකල්ප හා කුසලතා සමග එකට ගැලපී ජීවත්වීමට ද ඔහු උගනී. ඔහු මෙසේ ඉගෙනගනු ලබන්නේ සිය සංස්කෘතික පර්යායට අයත් ලක්ෂණයන් ය. මේ අනුව මිනිසා සතු සංස්කෘතිය යනු ඉගෙනගත් හැසිරීම් රටාවකි. සත්ත්වයන් අතර සංස්කෘතික පර්යායක් නැත්තේ ඔවුනට ඉගෙනීමේ හැකියාව නොමැති හෙයිනි. මිනිසා සිය ජීවන ක්‍රියාවලිය තුළ අන්තර් ක්‍රියාකාරිත්වය මගින් සංස්කෘතිය සතු සියලු ලක්ෂණ ඉගෙන එක් පරපුරක සිට තවත් පරපුරකට එම සංස්කෘතිය පවරා දෙනු ලබයි.

මේ අනුව මිනිසා විසින් ස්වභාවික පර්යායෙන් ඉවත්ව නිර්මාණය කරගත්, සංස්කෘතිය, ඉගෙනීමේ ක්‍රියාවලිය "සංස්කෘත්‍යායනය" (Culturalization) ලෙසින් හැඳින්වේ. එසේ තම සංස්කෘතිය සතු ලක්ෂණ සියල්ල ඉගෙන, තමා අයත් වන සමාජය සතු සාරධර්ම, සිරිත් විරිත්, වටිනාකම් ද තව දුරටත් උගනීමට යොමුවේ. එම ක්‍රියාවලිය "සමාජානුයෝජනය" (Socialization) නමින් හැඳින්වේ. බැලූ බැල්මට මෙම ක්‍රියාවලීන් දෙක අතර වෙනසක් නොපෙනේ. නමුත් එහි වෙනසක් පවතී. සිරිත් විරිත්, ඇදහිලි, විශ්වාස ඉගෙනීම හා එය තම ජීවිතයට එකතු කරගැනීම සංස්කෘත්‍යායනය යි. එම දේ අනුගමනය කිරීමෙන් සමාජයට අනුව හැඩගැසීම මගින් සමාජයට එකතුවීම සමාජානුයෝජනය ලෙස අර්ථවත් වේ (රත්නපාල, 2001).

**මුල්බුදුසමය හා සමාජානුයෝජනය ක්‍රියාවලිය**

මුල් බුදුසමයෙහි මිනිසා පිළිබඳ ව වූ සමාජානුයෝජනය ක්‍රියාවලිය සම්බන්ධයෙන් සෘජුව යමක් සඳහන්වන සෙයක් නොපෙනේ. එහෙත් සූත්‍ර පිටකාගත විවිධ සූත්‍ර දේශනාවලින් මෙන් ම විනය පිටකාගත ශික්ෂා පැනවීම් මගින් ද සමාජානුයෝජනමය ස්වභාවයකින් යුතු ක්‍රියාවලියක් ප්‍රකට වේ. මූලික වශයෙන් ම මිනිසා සමාජයීය සත්ත්වයෙකු ලෙස පිළිගන්නා මුල්බුදුසමය, ඔහු ක්‍රියාකරනුයේ සමාජයීය සංදර්භයක බව එකහෙළා ම අවධාරණය කරන අයුරු සදිසා සංකල්පයෙන් ස්ඵුට වේ (දී. නි. සිඟාලක සූත්‍රය). සමාජ විරහිත

මිනිස් පැවැත්මක් පිළිබඳ ව මුල් බුදුසමය අවධාරණය නොකරයි. ඒ හෙයින් ම මිනිසා සමාජයීය සත්ත්වයෙකු වන බව ප්‍රබල හේතු සාධක සහිත ව අනාවරණය කෙරේ. මිනිසා සමාජ විරහිත වූ හුදකලාවූ වෙන් වූ පුද්ගලයකු නො වේ. ඔහු තමා අයත් සමස්ත භෞතික හා අභෞතික පරිසරයට ම අයත් වූවෙකි. ඔහුගේ පැවැත්ම සඳහා සමස්ත පරිසරය ම පාදක වේ. එහි දී මිනිසා යනු සමස්ත විශ්වයේ ම නිර්මාණය සඳහා ඍජුව දායක වන කුඩා ඒකකයක් හෙවත් සමස්තය ගොඩනැගීම සඳහා දායකවූ ඒකකයකි. සමාජානුයෝජනය පිළිබඳ බෞද්ධ සංකල්පය අර්ථවත් වන්නේ මෙම පසුබිමක ය. සමස්තය හෙවත් විශ්වය ගොඩනැගීමට දායකත්වය ලබා දෙන මිනිසාට සමස්තය නියෝජනය වන සමාජයෙන් බැහැරවී ක්‍රියාත්මක වීමට පවතින අවකාශය අල්ප වේ (ධර්මසිරි, 1988). ඔහු තමා අයත් සමාජයට ගැලපී කටයුතු කරන අයුරු උගත යුතු ය. සමාජානුයෝජනය ක්‍රියාවලිය උපකාරී වනුයේ ඒ සඳහා ය. සමාජානුයෝජනය පිළිබඳ බෞද්ධ සංකල්පයෙහි උච්චතම ප්‍රාප්තිය වන අති උත්තර පෞරුෂයකින් සමන්විත වන පුද්ගලයා හෙවත් රහතන් වහන්සේ කෙනෙකු බිහිවන්නේ තමා මේ සමාජයට ගැලපී සිටින ආකාරය නිවැරදි ව තේරුම් ගැනීමෙනි. ඒ පිළිබඳව ඉගෙනීමෙනි. "පෘථග්ජන" ස්වභාවයෙන් තොරව කටයුතු කරන තැනැත්තා තමා සමස්ත සමාජය හෙවත් අන්‍යයන් සමග බැඳී සිටින අන්තර් පරායත්ත ස්වභාවයෙන් (Inter dependence) යුතු අයෙකු බව වටහා ගනියි (හෙට්ටිආරච්චි, 2001).

මේ අනුව ප්‍රකට වන වැදගත් ලක්ෂණය වන්නේ සියලු ආකාර බෞද්ධ ඉගැන්වීම් සමාජානුයෝජනමය ස්වභාවයෙන් හා අධ්‍යාපනික ස්වභාවයෙන් සමන්විත වන බව ය. ඒ අතර සීලය, සදිසා සංකල්පය, සතර බ්‍රහ්ම විහාර, සතර සංග්‍රහ වස්තු, සමාජ සාමාග්‍රීකරණ ධර්ම, දස පාරමිතා, සප්ත අපරිහානීය ධර්ම, දස රාජ ධර්ම ආදී බෞද්ධ සංකල්ප සියල්ලක් ම සමාජානුයෝජනය කෙරෙහි අදාළ වන බව පැහැදිලි ය. ඒ හැරුණු විට බෞද්ධ සමාජානුයෝජනයෙහි උච්චතම ප්‍රාප්තිය වන ''අරහන්ත'' ස්වභාවය කරා දිවෙන නිර්වාණගාමී ප්‍රතිපදාවෙන් අර්ථවත් වන ආධ්‍යාත්මික සමාජානුයෝජනය ක්‍රියාවලියෙහි ද පුද්ගලයා නිරත කරවන ස්වභාවයක් ප්‍රකට වේ. එමගින් සපුරාම ප්‍රකට වනුයේ අධ්‍යාපන ක්‍රියාවලියකි. සමාජානුයෝජනය පිළිබඳ ක්‍රියාවලියෙහි ප්‍රවේශ බෞද්ධ විග්‍රහයට අනුව සමාජානුයෝජනය

ක්‍රියාවලිය හා අදාළ ප්‍රමුඛ ස්වභාවයන් දෙකක් පහදා දිය හැකි ය.

1. ලෞකික සමාජානුයෝජනය

2. ආධ්‍යාත්මික සමාජානුයෝජනය

**ලෞකික සමාජානුයෝජනය**

මිනිසාගේ වර්තමාන ජීවිතය යහපැවැත්මෙන් යුතු ප්‍රසන්න වූවක් බවට පත්කරලීම ලෞකික සමාජානුයෝජනයෙහි කාර්යය වේ. ඒ සඳහා මිනිසා තමා අයත් සමාජය විසින් සම්මත සාරධර්ම, චාරිත්‍ර වාරිත්‍ර, ඇගයුම්, වටිනාකම් ආදියට අනුගත ව කටයුතු කිරීමට හුරු පුරුදු වියයුතු ය. වෙනත් වචනවලින් කිවහොත් මිනිසකු වශයෙන් තම වර්තමාන ජීවන පැවැත්ම උචිත ලෙස හැඩගසාගැනීම හෙවත් පොදු සමාජයට අදාළ ලෙස අනුගත වීම ලෞකික සමාජානුයෝජනය ක්‍රියාවලියෙන් අර්ථවත් වේ. ඒ සඳහා අනුගතවීමේ දී මිනිසාගේ මෙලොව ජීවිතය සැපවත්ව ගතකිරීම සඳහා අවශ්‍ය වන පිළිවෙත්හි හැඩගැසීම අත්‍යවශ්‍ය වේ. එම පිළිවෙත් මනාව උගත යුතු වේ.

සමාජයට උචිත පරිදි හැඩගැසීමටත්, අන් අයට ගැලපෙන ලෙස හැඩගැසීමටත්, තම සහජීවීන් සමග නොගැටී ජීවත් වීමටත් හැකි පරිසරයක් ගොඩනගා ගැනීම ලෞකික සමාජානුයෝජනයෙහි අපේක්ෂාව වේ (Rathnapala, 1993). මුල් බුදුසමය ප්‍රකට කරන ලෞකික සමාජානුයෝජනයෙහි විශිෂ්ට ලක්ෂණය වන්නේ එය හුදෙක් සමාජයට හුරුවීමක් පමණක් ම නොවී මිනිසා තම ජීවිතය ප්‍රසන්න වූවක් බවට පත්කර ගැනීම මෙන් ම අන්‍යයන්ගේ ජීවිත පැවැත්ම ද ප්‍රසන්න වූවක් බවට පත්කරලීමට යොමුවූ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියක් වීම ය.

**ආධ්‍යාත්මික සමාජානුයෝජනය**

ආධ්‍යාත්මික සමාජානුයෝජනය යනු බෞද්ධ සමාජානුයෝජනය සංකල්පයෙහි පරම නිෂ්ඨාව වන නිර්වාණගාමී ප්‍රතිපදාවෙහි අනුයෝජනය වීම යි. මිනිස් සිතේ පහළ වන විවිධ අයහපත් සිතිවිලි බැහැර කර යහපත් සිතිවිලි වර්ධනය කරගැනීම තුළින් පූර්ණ වශයෙන් ලබන විමුක්තිය හෙවත් නිර්වාණය ආධ්‍යාත්මික

සමාජානුයෝජනයේ උච්ච ඵලය වේ. මෙහිදී මිනිසා පූර්ණ වශයෙන් සිය පෞරුෂය හැඩගස්වා ගනියි. මිනිසාගේ සාමාන්‍ය ස්වභාවය වන්නේ, විශ්වීය ස්වභාවය පිළිබඳ යථාවබෝධය නොමැතිවීම හෙවත් "අවිද්‍යාව" තුළ සිරවූවෙකු ලෙස කටයුතු කිරීම යි. අවිද්‍යාව නිසා ජනිතවන සුඛකාමීත්වය හෙවත් තෘෂ්ණාව මිනිසාගේ ශක්‍යතා ආවරණය කරයි. එහි ප්‍රතිඵලය වන්නේ මිනිසා ආත්ම කේන්ද්‍රීය ගති ලක්‍ෂණ ප්‍රකට කරන්නෙකු බවට පත්වීම ය. මේ නිසා ඔහු ආත්ම කේන්ද්‍රීය චක්‍රය තුළ තෘෂ්ණාවෙන් බැඳෙමින් ජීවත් වේ. මෙලොව වශයෙන් ඔහුගේ පැවැත්මට අවශ්‍ය සමාජයීය බැඳීම් සමුදායට උචිත චර්යාමය හැඩගැස්වීම හෙවත් මූලික පෞරුෂය ගොඩනැංවීම ලෞකික සමාජානුයෝජනයෙන් අපේක්‍ෂා කෙරේ. ආධ්‍යාත්මික සමාජානුයෝජනයට අවශ්‍ය වන්නේ තෘෂ්ණාව බිඳ දැමීමෙන්, භව චක්‍රය කඩා දමා උත්තර මානුෂීය ස්වභාවයට පුද්ගල පෞරුෂය ගොඩනංවා ගැනීම යි. එකී උත්තර මානුෂීය ස්වභාවය ලබන්නෝ ස්වල්පය හ (ධම්මපදපාළි; පණ්ඩිත වග්ග; ගාථාව 85). ප්‍රාප්ති අවස්ථාවන් කිහිපයකදී මිනිසා තම අයහපත් සිතිවිලි අනුක්‍රමයෙන් බැහැර කරන අතර අවසානයේදී සියලු ආකාර අයහපත් සිතිවිලි ක්ෂය කරමින් ආධ්‍යාත්මික සමාජානුයෝජනයෙහි කූට ප්‍රාප්තියට ළඟාවේ. සමාජානුයෝජනමය ක්‍රියාවලියෙන් උත්තර හා අති උත්තර ලක්‍ෂණ සහිත පෞරුෂයන් හිමි පුද්ගලයන් බිහිවන හෙයින් ආධ්‍යාත්මික සමාජානුයෝජනය ක්‍රියාවලිය උත්තර හා අති උත්තර පෞරුෂීය සමාජානුයෝජනය ලෙස හැඳින් වීම ද උචිත ය.

### සමාජානුයෝජනය පිළිබඳ බෞද්ධ සංකල්පයෙහි පදනම

සමාජය යනු එක් අයෙකුට වඩා වැඩි මිනිසුන් පිරිසක් නිශ්චිත සංස්කෘතියකට අනුව සම්බන්ධතා පැවැත්වීමේ ක්‍රියාවලිය යි. එහි දී ඔහු ස්වභාව ධර්මය ස්වභාවික සම්පත් බවට පත්කර ගනිමින් සිය අද්විතීය සංස්කෘතියේ පැවැත්ම ඉදිරියට ගෙන යාමට අවශ්‍ය පෞරුෂය නිර්මාණය කරයි. මේ නිසා නිරන්තරයෙන් ම ජීවී අජීවී ලෝකය සිය සංස්කෘතියට අනුව නිර්වචනය කිරීම කරනු ලබන අතර අජීව ලෝකය තමන්ගේ නිර්ණායකයන්ට යටත් කරගනු ලබයි. මෙහිදී තමාට අවශ්‍ය පරිදි ආත්මකේන්ද්‍රීය ව පමණක් පුද්ගලයාට සිය ජීවිතය පවත්වාගත නොහැකිය. ඔහු විසින් සිය චර්යා රටාව

ප්‍රකට කළ යුත්තේ තමා හා විශ්වීය සමාජ පර්යාය අතර පවත්නා අන්තර් පරායත්ත ස්වභාවය ප්‍රකට වන ලෙස ය. සැබවින් ම ඔහු ජීවත්විය යුත්තේ තමා අයත් සමාජයේ අවශ්‍යතාවන්ට අනුව ය. පෙර සඳහන් කළ පරිදි මිනිසා යනු සමස්ත විශ්වයේ ඒකකයක් පමණි. සමස්තය ඒකකය කෙරෙහි බලපාන අතර ඒකකය සමස්තය කෙරෙහි බලපායි (ධර්මසිරි, 1988). මෙයින් ප්‍රකට වන අර්ථය ඉතා පැහැදිලි ය. මිනිසා නම් වූ ඒකකය සමාජයේ යහ පැවැත්මට අදාළ ව ක්‍රියාත්මක විය යුතුය. ඒ සඳහා ඔහු සමාජයීය අවශ්‍යතා හඳුනාගෙන ඒ අනුව හැඩගැසිය යුතු බව සමාජානුයෝජනය නම් වූ අධ්‍යාපනමය අගයකින් යුත් ක්‍රියාවලියෙන් ප්‍රකට කෙරෙන සුවිශේෂී ලක්ෂණය වේ. එකී සමාජානුයෝජනය පිළිබඳ බෞද්ධ සංකල්පයෙහි පදනම වන්නේ සදාචාරය යි. සදාචාරය (සද් + ආචාරය) යනු යහපත් හැසිරීම හෙවත් සීලය යි. සීලය යනු මිනිසා සතු සදාචාරය ප්‍රකට කරවනු ලබන ක්‍රියාවලිය හඳුන්වනු ලබන පාරිභාෂික නාමය යි. එමගින් මිනිසාගේ කායික හා වාචසික සංවරය හැඳින්වේ (නෙතතිපපකරණය; පිටුව 120). පුරුදු කිරීම, හික්මීම, හීලෑ කිරීම (සීලන) යන අර්ථයෙන් සීලය යන වචනය සෑදී ඇත (සිංහල විශුද්ධි මාර්ගය; 1959). ඒ අනුව යහපත් වූ කායික වාචසික ක්‍රියා එක් රැස්කිරීම (සමාධානය) එවැනි ක්‍රියා දරා සිටීම (උපධාරණය) යන අදහසින් පුරුදු කිරීම හා හික්මීම යන අර්ථයන් සීලය යන්නෙන් ප්‍රකට වේ.

සමාජානුයෝජනය ක්‍රියාවලිය පුද්ගල චර්යාවන් හා බැඳී පවතී. එහෙයින් මිනිසාගේ චර්යාවන් ප්‍රකට වන ආකෘතීන් හඳුනාගැනීම වැදගත් ය. එම ආකෘතීන් ප්‍රධාන වශයෙන් තෙවැදෑරුම් ය.

1. කායික ආකෘතිය

2. වාචසික ආකෘතිය

3. මානසික ආකෘතිය

මිනිසා සතු චින්තනමය හැකියාව මෙම ආකෘති අතර ප්‍රමුඛ වේ. පුද්ගලයා සිය කායික චර්යා හා වාචසික චර්යා හැඩගස්වාගනු ලබන්නේ මානසික ස්වභාවය පදනම් කරගෙන ය (ම.නි.3; චූළකම්ම

විභංග සූත්‍රය). තව දුරටත් මෙම ස්වභාවය පැහැදිලි කරගන්නේ නම් මිනිසාගේ චින්තනය හෙවත් මානසික ආකෘතියට අනුව කායික හැඩගැසීම සිදු වේ. කායික හැඩගැස්වීමේ ක්‍රියාවලියේ දී මානසික ආකෘතිය නිරූපණය වන තවත් පැතිකඩක් ලෙස වාචික ක්‍රියාවලිය සුවිශේෂී වේ. එයට හේතුව වන්නේ වචන නිර්මාණය කළ හැක්කේ මිනිසුනට පමණක් වන හෙයිනි. සමාජානුයෝජනය ක්‍රියාවලියෙහි පදනම වන සීලය හෙවත් සදාචාරය පුද්ගලයාගේ කායික හා වාචසික චර්යා යහපත් ලෙස හැසිරවිය යුතු අයුරු දක්වන ක්‍රමවේදයකි. සීලය පුද්ගලයාගේ කායික හැසිරීම හා වාචික හැසිරීම නිවැරදි ව මෙහෙයවයි. පුද්ගලයා කායික වශයෙන් හා වාචසික වශයෙන් මනාව ශික්ෂණයක් නොලැබීම සමාජානුයෝජනය ක්‍රියාවලිය අඩාළ කරවීමට හේතු වේ. තමා අයත් සමාජයට උචිත ලෙස හා යහපත් ලෙස හැඩනොගැසීම යනු එම සමාජය විසංවිධානයට හේතුවක් ලෙස දැක්වීම යුක්ති යුක්ත ය. සමාජය යන සමස්තය සකස් ව ඇත්තේ පුද්ගලයා නැමැති ඒකකයෙනි. ඒ අනුව එකී සමස්තයට අයත් ඒකකයක් සමාජානුයෝජනය නොවීම සමස්තයේ විසංවිධානයට හේතු වේ.

සීලය නම් වූ සදාචාරමය චර්යාව සමාජය කෙරෙහි ප්‍රබල බලපෑමක් කරනු ලබයි. සමස්ත මිනිස් වර්ගයාට සිය ජීවිතය පවත්වා ගෙන යාම උචිත ප්‍රසන්න සමාජ පරිසරයක් සැකසීම සීලයෙන් සිදුවන වැදගත් කාර්යය භාරය යි. සමාජයක යහපැවැත්ම රඳා පවතිනුයේ සමාජයක මිනිස් සමූහයා සදාචාර සම්පන්න වුවහොත් පමණි. උදාහරණ ලෙස පඤ්චසීල ප්‍රතිපදාව ගතහොත් එමගින් ගම්‍ය වන්නේ තම සහජීවීන්ගේ අයිතිවාසිකම් සුරක්ෂිත කරන ඔවුන්ගේ යහපැවැත්ම තහවුරු කරවන ස්වභාවය යි. මෙම ස්වභාවය සීලයෙහි සමාජමය කාර්යභාරය ලෙස ගිණීම උචිත ය. සීලය හෙවත් සදාචාරය සමාජානුයෝජනය ක්‍රියාවලිය කෙරෙහි අදාළ වන්නේ "අත්තූපනායික ධර්ම පරියාය" හෙවත් තමන් උපමාවට ගෙන කටයුතු කිරීමේ පිළිවෙත මත ය (ස.නි. 5-2 වේළුද්වාර සූත්‍රය). කිසිවෙකු තමන්ට හිංසා පීඩා කරනවාට තමන් අකැමැති වන්නා සේ ම අන්‍යයන් ද එසේ ම අකැමැති බව වටහාගෙන අනුනට හිංසා පීඩා කිරීමෙන් වැළකීම බෞද්ධ සදාචාරයේ මූලික ස්වභාවය යි. මෙසේ තමා උපමා කොට අනුන් ගැන සිතීම සදාචාරය හෙවත් සීලයෙහි විශිෂ්ට ලක්ෂණයකි.

මේ අනුව මිනිසා තුළ අන්‍යයන් හෙවත් සමාජය පිළිබඳ සංවේදිතාවක් ඇති කර ගැනීමට සීලය නම් වූ සදාචාර මාර්ගය උපස්ථම්භක වේ. මිනිසා තම කායික චර්යාවන් හා වාචසික චර්යාවන් සමාජයට උචිත ලෙස හැඩගසා ගැනීම යනු සමාජානුයෝජනය ක්‍රියාවලියෙහි යහපත් ප්‍රතිඵලයකි. මෙසේ සමාජයට උචිත පරිදි පුද්ගලයා හැඩගැසීම සඳහා ඉවහල් වන සීලය නම් වූ පදනම සමාජානුයෝජනය පිළිබඳ බෞද්ධ සංකල්පයෙහි ආසන්නතම අරමුණ වන ලෞකික සමාජානුයෝජනය ක්‍රියාවලිය පිළිබඳවත් එහි අවසාන පරමාර්ථය වන ආධ්‍යාත්මික සමාජානුයෝජනය හෙවත් උත්තර හා අති උත්තර පෞරුෂීය සමාජානුයෝජනය පිළිබඳවත් ගාමක බලවේගය වන්නේ ය.

### ලෞකික සමාජානුයෝජනය ක්‍රියාවලිය

කාමභෝගී ජීවිත ගත කරන ගිහි පක්ෂය සඳහා අදාළ වන සමාජානුයෝජනය ක්‍රියාවලිය ලෞකික සමාජානුයෝජනය ලෙස අර්ථ සීමනය උචිත ය. 'ගිහි' යන පදය භාවිත කරන්නේ ගෘහවාසී ව පවුල් ජීවිත ගත කරන භෞතික සැප සම්පත් සම්පූර්ණ කරගැනීමෙහි නිරත වූවෙකු හැඳින්වීමට ය (ප්‍රේමසිරි, 1992). ගිහි ජීවිත ගතකරන පුද්ගලයන්ගේ මෙලොව ජීවිතය යහපැවැත්මෙන් යුතු වූවක් ලෙස සකස් කරගැනීමට අදාළ සදාචාරමය පදනමකින් යුත් ඉගැන්වීම් සමුදායක් සූත්‍ර පිටකාගත දේශනාවන්හි අන්තර්ගත වේ. එම ඉගැන්වීම් සියල්ල ම ප්‍රකට කරනුයේ සමාජයීය සත්ත්වයකු වශයෙන් මිනිසා තමා අයත් සමාජයට හැඩගැසිය යුතු ආකාරය හෙවත් සමාජානුයෝජනය විය යුතු ආකාරය යි. එම සමාජානුයෝජනය ක්‍රියාවලිය මිනිසාගේ පවත්නා ජීවිතය වඩාත් ප්‍රසන්න යහපත් වූවක් බවට පත්කරලීමට උපස්ථම්භක වන අයුරු මුල් බුදුසමයෙහි අදාළ දේශනා තුළින් ප්‍රකට කෙරේ.

කාමභෝගී ගිහි ජීවිත ගතකරන ගිහියාගේ සමාජ ජීවිතය මූලික අංශ දෙකක් කෙරෙහි යොමුවී පවතී. එනම් මිනිසාගේ සදාචාර ජීවිතය හා ආර්ථික ජීවිතය යන අංශ දෙක කෙරෙහි ය (ප්‍රේමසිරි, 1992). මිනිසාගේ මෙම ජීවන රටාවන් දෙක අතර සමතුලිත ස්වභාවයක් ඇතිකරලීම ලෞකික සමාජානුයෝජනය පිළිබඳ ක්‍රියාවලියෙහි අපේක්ෂාව බව නිගමනය කිරීම නිවැරදි ය. ලෞකික

සමාජානුයෝජනය පිළිබඳ බෞද්ධ සංකල්පයෙහි ප්‍රවේශ දෙකක් බෙදා දැක්විය හැකි ය.

1. සදාචාරය පිළිබඳ සමාජානුයෝජනය
2. ආර්ථිකය පිළිබඳ සමාජානුයෝජනය

**සදාචාරය පිළිබඳ සමාජානුයෝජනය**

විශ්වයෙහි පවත්නා පර්යාය දෙකෙන් මිනිසා අයත් වන්නේ සංස්කෘතික පර්යායට ය (හේරත්, 2001). සංස්කෘතික සත්ත්වයකු වන මිනිසා සිය චර්යාවන්ගෙන් තිරිසන්ගත සත්ත්ව ස්වභාවය බැහැර කරයි. ඔහු සියලු චර්යාවන් සිදු කරනුයේ ශික්ෂණමය රටාවකට අනුව ය. එම ශික්ෂණමය රටාවෙහි පදනම වනුයේ සදාචාරය හෙවත් සීලය යි. සීලයෙහි මුඛ්‍ය පරමාර්ථය වන්නේ කායික හා වාචසික සංවරය යි. මිනිසා එම චර්යාවන්හි අසංවරවීම යනු සමස්ත සමාජ සංවිධානය ම බිඳ වැටීම බව පැහැදිලි ය (ධම්මානන්ද, 2004). සමාජයෙහි තැනුම් ඒකකය වන මිනිසා සදාචාර සම්පන්න විය යුතු ය. සදාචාර සම්පන්නභාවය සමස්ත සමාජය ජීවත්වීමට උචිත පරිසරයක් ලෙස නිර්මාණය කරනු ලබයි. මේ සඳහා සමාජගත මිනිසා සදාචාරමය පිළිවෙත්හි අනුයෝජනය කරවීම සඳහා උචිත ප්‍රවේශ මුල් බුදුසමයෙහි නිර්දිෂ්ට වේ (දී.නි. 3, සිගාලක සූත්‍රය). එම ප්‍රවේශ සමාජානුයෝජනමය ජීවී ගුණයෙන් පෝෂිත ය. මෙම සදාචාර ප්‍රවේශ එනම් යහපත් මිනිස් චර්යා, භාවිතයන්, ගති පැවතුම්, ගුණ ධර්ම, චාරිත්‍ර වාරිත්‍ර, සාරධර්ම ආදිය සමස්ත මානව සමාජය ම යහපත් ලෙස සමාජානුයෝජනය කරවීමට සමත්වේ. මිනිස් ජීවන රටාවෙහි යහවර්ධනයක් ජනිත කරලීම අරමුණු කරගත් එම ප්‍රතිපදා සමූහය මිනිසාගේ වර්තමාන ජීවන රටාව හැඩගස්වනු ලබන හෙයින් ලෞකික සමාජානුයෝජනයෙහි සදාචාරය පිළිබඳ සමාජානුයෝජනය ලෙස හැඳින්වීම යුක්ති යුක්ත ය. එහෙත් මෙහිදී අප මතක තබාගත යුත්තක් වන්නේ බෞද්ධ සදාචාරයෙහි පරම නිෂ්ඨාව නිර්වාණය වන බව යි. මිනිසා ආධ්‍යාත්මික සමාජානුයෝජනය ක්‍රියාවලියට ප්‍රවේශ වීමට පෙරාතු ව ලෞකික ජීවිතය පිළිබඳ සදාචාරයෙහි පිහිටිය යුතු බව මුල් බුදුසමය අවධාරණය කරන බව පැහැදිලි වේ[33] (ස.නි. 5-2 වේළුද්වාර සූත්‍රය).

ලෞකික සමාජානුයෝජනයෙහි ප්‍රවේශ දක්වන සටහන

සදාචාරය පිළිබඳ සමාජානුයෝජනය

ආර්ථිකය පිළිබඳ සමාජානුයෝජනය

**පංචසීල සංකල්පය**

සදාචාරය පිළිබඳ මූලික ම ඉගැන්වීම් ලෙස බුදුසමය හඳුන්වා දෙන්නේ පඤ්චසීල ප්‍රතිපදාව යි. කාමභෝගී ගිහි ජනතාව සඳහා භාවිත වන ප්‍රාථමික ම ශික්‍ෂණ ක්‍රමය වන්නේ ද පංච සීලය යි. මේ අනුව සමාජානුයෝජනය පිළිබඳ සංකල්පයෙහි මූලික ප්‍රවේශය ආරම්භ වන්නේ පංච ශීලයෙනි. එනිසා ම පංචසීලය මිනිසාගේ සමාජගත ජීවිතය වඩාත් ප්‍රසන්න ස්වභාවයකට පත්කරලීමේ මූලික සමාජානුයෝජනමය ක්‍රියාවලිය ලෙස ද සම්භාවනාවට ලක් වේ (Gnanarama;1996). එසේ ම පූර්ණ පෞරුෂීය වර්ධනය සඳහා ද උපස්ථම්භක වන එහි අධ්‍යාපනික ස්වභාවයක් ද ප්‍රකට වේ. සමස්ත සත්ත්ව වර්ගයාගේ ජීවත්වීමේ අයිතිය, පෞද්ගලික හා පොදු දේපොළ පරිහරණයේ අයිතිය, නිර්බාධිත පවුල් ජීවිත ගතකිරීමේ අයිතිය, සත්‍යය දැනගැනීමේ හා ප්‍රකාශ කිරීමේ අයිතිය හා ප්‍රකෘති සිහියෙන් යුතුව කටයුතු කිරීමේ අයිතිය සුරැකීම යනු එම සීලයෙහි අංගයන් ය (දී.නි.3; සංගීති සූත්‍රය). පංච සීල ප්‍රතිපාදාවෙහි කිසියම් ධුරාවලියක ස්වභාවයක් ද ප්‍රකට වේ. ඒ අනුව එහි ප්‍රථම ශික්‍ෂාව වන්නේ ප්‍රාණඝාතයෙන් දුරුවීම යි. විශ්වයෙහි නිවසක සියලු ම සත්ත්වයෝ ජීවිතය ප්‍රිය කරති (සබ්බෙසං ජීවිතං පියං) (ඛු.නි. ධම්මපදපාළි; දණ්ඩ වග්ගය). එහෙයින් තමා උපමාවට ගෙන අන්‍යයෙකුගේ හෝ අන් සතෙකුගේ හෝ ජීවිතය තොර කිරීම නොකළ යුතු බව මෙයින් ප්‍රකට වේ. විශ්වීය සමස්ත සත්ත්ව වර්ගයාගේ ම ජීවන අයිතිය සුරැකීම සමාජයීය සත්ත්වයෙකු වශයෙන් මිනිසා විසින් පිළිපැදිය යුතු සමාජානුයෝජනමය අගයකින් යුතු මූලික ම සදාචාරමය ක්‍රියාව

වේ. මෙය සමාජගත සහජීවීන් හා නොගැටී ඔවුනගේ ජීවිත සුරක්ෂිත වන ලෙස ක්‍රියා කිරීම තුළින් හෙවත් ප්‍රාණඝාතයෙන් වැළකීමෙන් පමණක් නැවතිය යුතු ක්‍රමයක් පමණක් ම නොවේ. එය සමස්ත ජීවී සංහතියේ යහපත පිණිස කරනු ලබන කැපකිරීමකි. අන්‍යයන්ගේ යහපත පිණිස කරනු ලබන කැපකිරීමකි. අන්‍යයන්ගේ ජීවිත සුරකින තැනැත්තා ගුණ ධර්ම රාශියක් වර්ධනය කරගනියි. අවි ආයුධ භාවිතය අතහරියි. වැරදි චර්යා කෙරෙහි ලැජ්ජා ඇත්තේ වේ. කාරුණිකභාවය වර්ධනය කරගනියි. සියලු ජීවීන් කෙරෙහි අනුකම්පාව පතුරුවයි(දී.නි. 1, සාමඤ්ඤඵල සූත්‍රය). පංච සීලයෙහි දෙවැන්න අන් සතු දෑ පැහැර නොගැනීම යි. හෙවත් නුදුන් දෙය ගැනීමෙන් වැළකීම යි. පංචසීල ප්‍රතිපදාවෙහි ධුරාවලි ස්වභාවය තහවුරු කරමින් ජීවිතය සුරක්ෂිත කරගන්නා අයට ජීවිතය පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය සාධක එනම් දේපොළ, මිල මුදල්, වස්තූන් ආදිය සුරක්ෂිත කිරීම සිදුවිය යුතු ය. මිනිසා ස්වභාවික පර්යායෙන් ඉවත් ව සංස්කෘතික පර්යායට එක්වූ පසු සිය පරිභෝජනය සඳහා අවශ්‍ය භාණ්ඩ හා සේවා නිෂ්පාදනයට යොමු වේ. මෙම නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා අවශ්‍ය ශ්‍රමය වැය කිරීමට ද ඔහුට සිදු වේ. මේ හෙයින් නිෂ්පාදනය අන්සතු කරගැනීම හෝ සොරකම් කිරීම බලවත් වරදකි (හේරත්, 2001). අනෙකකු විසින් ශ්‍රමය වැයකොට නිෂ්පාදනය කළ දෙයක් සොරාගැනීම තුළ ශ්‍රමයෙහි වටිනාකම නැතිව යයි. එනිසා අන් සතු දැය පැහැර ගැනීම සමාජ විරෝධී ක්‍රියාවකි. අප සතු පාරිභෝගික භාණ්ඩ පිළිබඳ ව සහතිකය දෙවැනි සිල් පදය මගින් ලබා දෙයි. සමාජානුයෝජනය ක්‍රියාවලියට අනුගතවන පුද්ගලයා මෙම ස්වභාවය මනාව තේරුම් ගෙන නුදුන් දෙය ගැනීමෙන් වැළකී ත්‍යාග චේතනා වර්ධනය කරගෙන පිරිසිදු දිවි පෙවෙතක් ගතකළ යුතු අයුරු මුල් බුදුසමය ප්‍රකට කරයි (දී.නි. 1; සාමඤ්ඤඵල සූත්‍රය).

සංස්කෘතික සත්ත්වයකු වන මිනිසා ක්‍රියාකරනුයේ තම සංස්කෘතික පිළිවෙත්වලට අනුගතව ය. එනිසා ම ඔහුට වැරදි ලෙස කාමයෙහි හැසිරීමට අවකාශයක් නොමැත. පවුල නම් වූ මූලික ම සමාජ ඒකකයේ පැවැත්ම, සන්තෘෂ්ටිය, පවතින්නේ සැමියා හා බිරිඳ අතර පවත්නා අන්‍යොන්‍ය ලිංගික කැපකිරීම හා සහජීවනය මත ය. සංස්කෘතික සත්ත්වයකු වීම නිසා මිනිසා සිය සමාජ ජීවිතයේ දී විවිධ ව්‍යභිචාරී තහංචි පනවා ගනියි. එහෙයින් එක් ස්ත්‍රියක එක්

පුරුෂයෙකු සමගත්, එක් පුරුෂයෙකු එක් ස්ත්‍රියක සමගත් ලිංගික සබඳතා පැවත්වීම මිනිස් සමාජයේ යහපැවැත්ම සුරක්ෂිත කිරීමකි. එම යහපැවැත්ම විනාශකර දමන විවිධ වූ ව්‍යතික්‍රම සමාජගත සාමාජිකයන් විසින් සිදු කරනු ලබන්නේ නම් එය මනා සමාජානුයෝජනයක් නොලැබීමේ හේතුවෙන් සිදුවන්නකි. වැරදි ලෙස කාමයෙහි හැසිරීම දැඩිව ප්‍රතික්ෂේප කරන මුල් බුදුසමය ස්ත්‍රීන් කෙරෙහි නිවැරදි ලෙස පිළිපැදිය යුතුබව දක්වයි. මව්පිය රැකවරණය යටතේ හෝ සොයුරු සොයුරියන්ගේ රැකවරණය යටතේ හෝ ඥාතීන් ගේ රැකවරණය යටතේ ජීවත් වන හෝ විවාහ වූ හෝ විවාහ ගිවිසගත් ස්ත්‍රියක කෙරෙහි වැරදි ලෙස පිළිපැදීම හෙවත් කාම මිථ්‍යාචාරය පූර්ණ සමාජානුයෝජනය පිළිබඳ ව ගැටලු ඇති කරයි (ම.නි. 1, සාලෙය්‍යක සූත්‍රය). සමාජානුයෝජනය පිළිබඳ මූලික ම වගකීම් භාරය පැවැරෙන පවුල නම් වූ සමාජ ඒකකය අවුල් කරලීමට සමත් කාම මිථ්‍යාචාරය දුරලීම සමාජයට කරනු ලබන මහගු සේවයකි. සමගි සම්පන්න ව ප්‍රසන්න ලෙස විවාහ ජීවිත ගතකරන ස්ත්‍රී පුරුෂයන් සහිත සමාජය යහපත් සමාජ පරිසරයකි. මෙම ශික්ෂාපදය මගින් ප්‍රකට කෙරෙන අර්ථය වන්නේ මිනිසා තම බුද්ධිය, දැනුම, ශික්ෂණය තුළින් රාගී චේතනා දුරලීමට සමත් විය යුතු බව ය. එසේ කළ යුත්තේ ඔහු සංස්කෘතික සත්ත්වයෙකු වන හෙයිනි. සමාජ විසංවිධානයට හේතු සාධක වන කාම මිථ්‍යාචාරය බැහැර කර කාම සේවනයෙහි නිරතවීම ශික්ෂණයක් සහිත ව සිදු කිරීම සමාජානුයෝජනමය උපක්‍රමයක් ලෙස අගය කළ යුත්තකි. මිනිස් සමාජයෙහි පැවැත්ම සඳහා මූලික සාධකය වන්නේ පුද්ගලාන්තර සම්බන්ධතාවන් ය. මෙම සම්බන්ධතා පවත්වා ගැනීමෙහි ලා අත්‍යවශ්‍ය අංගය වන්නේ භාෂාව භාවිතය පිළිබඳ කුසලතාව යි. මනාව සමාජානුයෝජනය වූ මිනිසුන් සහිත සමාජයක අන්‍යොන්‍ය සම්භාෂණය හා සන්නිවේදනය පවතී. මෙකී සම්භාෂණය හා සන්නිවේදනය බිඳ හෙළන මූලික ම සාධකය වන්නේ සත්‍යවාදී නොවීම යි. මිනිස් සබඳතා වඩාත් යහපත් වන්නේත්, එම සබඳතා වඩාත් සුරක්ෂිත වන්නේත් භාෂා භාවිතයෙහි දක්වන සදාචාරාත්මක භාවය මත ය. භාෂාව භාවිත කොට අසත්‍ය ප්‍රකාශ කරන්නේ නම් සමාජගත සම්බන්ධතා බිඳ වැටේ. සමාජ විද්‍යාත්මක ව බලන කල්හි ද සන්නිවේදනය සත්‍යය මත පදනම් නොවන්නේ නම් සමාජ විසංවිධානයක් සිදුවේ (හේරත්, 2001). අවස්ථාවෝචිත වචන භාවිතය

(කාලෙන) පවත්නා දේ පිළිබඳව ම කතා කිරීම (භූතෙන) මෘදු වචන භාවිතය (සණ්හෙන), යහපත සලසන වචන භාවිතය (අත්‍ථසංහිතෙන) මිත්‍රශීලී වචන භාවිතය (මෙත්තෙන) යහපත් සමාජානුයෝජනමය ලක්‍ෂණයකි (ම.නි. 1, කකචූපම සූත්‍රය). මෙවැනි යහපැවැත්මෙන් යුතු පුද්ගලයා සත්‍යවාදී වේ. සත්‍යයෙන් සත්‍යය ගලපා ප්‍රකාශ කරයි. තහවුරු වූ සත්‍යය ම ප්‍රකාශ කරයි. විශ්වාස කළ හැකි කථා ඇත්තෙක් වේ. ඔහු සමාජය නොරවටන්නෙකි (දී.නි. 1, සාමඤ්ඤඵල සූත්‍රය).

මත්පැන් භාවිතය මිනිසාගේ ප්‍රකෘති ස්වභාවය විකෘති තත්ත්වයකට පත් කිරීමට හේතු වේ. සමාජයේ යහපැවැත්ම විනාශකිරීමට සමත් චර්යා සහිත පුද්ගලයා සමාජය විසංවිධානයට පත්කරයි. සිය සහජීවීන්ගේ පැවැත්ම යහපැවැත්මක් බවට පත් කරවනවා වෙනුවට පීඩාකාරී වාතාවරණයක් උද්ගත කරවීම මත්පැන් පානය නිසා විකෘති වූ චර්යා ඇත්තෙකුගෙන් සිදුවන අයහපතකි. සමාජගත පිරිස් තුළ බිය, වෛරය, ජනිත කරවන මත්පැන් භාවිතය සැබවින් ම මිනිසා අයහපතට යොමු කරවීමට සමත් ය. උමතු ව හා මුලාව ඇතිකරවීමට සමත්වන මත්පැන් භාවිතය සමාජය අසමතුලිත බවට පත්කරලීමට ඉවහල් වේ (සු.නි. ධම්මික සූත්‍රය).

සමාජ විද්‍යාත්මක එළඹුමකින් පංචසීලය පිළිබඳ ව අධ්‍යයනයක යෙදෙන කල්හි එහි වැදගත්කම මනාව ප්‍රකට වේ. විශ්වීය පර්යායක් වන ස්වාභාවික පර්යාය හා සංස්කෘතික පර්යාය තුළ පංචසීලය ක්‍රියාත්මක වන ආකාරය අවධානයට ලක්වීම අත්‍යවශ්‍ය වේ. ඒ අනුව පංච සීලයෙහි පළමු ශික්‍ෂාපදය ස්වභාවික පර්යායට අයත් වේ. එම පර්යායට අයත් වන්නේ ශාකලෝකය හා සත්ත්ව ලෝකය යි. ප්‍රාණඝාතයෙන් වැළකීම තුළින් ජීවි සමස්තය වන ශාක ලෝකය මෙන් ම සත්ත්ව ලෝකය ද සුරක්ෂිත වේ. සොරකම් කිරීමෙන් වැළකීම, කාම මිථ්‍යාචාරයෙන් වැළකීම, බොරු කීමෙන් වැළකීම හා මද්‍යපානයෙන් වැළකීම සංස්කෘතික පර්යාය හා සම්බන්ධ වේ (හේරත්, 2001). ඉහත සඳහන් දෑ පුහුණු කරමින් ස්වභාවික දරුවා සමාජයීය හෙවත් සංස්කෘතික දරුවෙකු බවට පත්කිරීම සමාජානුයෝජනයේ මූලික කාර්යය වේ. පංචසීලය කඩකිරීම නිසා සමාජානුයෝජනය පිළිබඳ බෞද්ධ සංකල්පයෙහි පදනම වන සදාචාරය (සීලය) බිඳ වැටේ. සැබවින් ම එයින් සිදුවන්නේ මිනිසා විසින් ම නිර්මාණය කරගත්

සංස්කෘතික පර්යායට අයත් අංගයන් කඩා බිඳ දැමීමකි. එහෙයින් මෙම ස්වභාවය ඉක්මවා නොයන්නේ නම් යහපත් සමාජානුයෝජනමය රටාවන් නිර්මාණය කරගත හැකි ය. එහි පදනම වන්නේ ද පඤ්චසීලය යි. සමාජානුයෝජනය ක්‍රියාවලිය සාර්ථක වීම සඳහා පඤ්චසීලය සුරකින පුද්ගලයා අනතුරු ව සිය චින්තනය නිවැරදි මෙහෙයවීම සඳහාත් සිය චර්යා රටාව වඩාත් යහපත් ලෙස හැඩගැස් වීම සඳහාත් වර්ධනය කරගත යුතු සද් ගුණයන් හි ද අනුයෝජනය වීම අත්‍යවශ්‍ය වේ. එවැනි සද් ගුණ පද්ධතියක් බ්‍රහ්ම විහාර සංකල්පයෙන් ප්‍රකට වේ.

**බ්‍රහ්ම විහාර සංකල්පය**

මිනිසා සිය සමාජයීය ජීවිතයේ දී පවත්වනු ලබන සමාජ සම්බන්ධතා යහපත් ලෙස හැඩගස්වා ගැනීම සඳහා සමාජානුයෝජනය ක්‍රියාවලිය උපකාරී වේ. එම සමාජ සම්බන්ධතා වඩාත් යහපත් අයුරින් පවත්වා ගෙනයාම සඳහා ඉවහල්වන සිතිවිලි හා චර්යා ජනිත කරවන සද් ගුණ පද්ධතියක් 'බ්‍රහ්ම විහාර' සංකල්පයෙන් විවරණය වේ. සදාචාරය පිළිබඳ බෞද්ධ සංකල්පයෙහි ප්‍රතිජනනාත්මක ගුණ ධර්ම වන මෙත්තා, කරුණා, මුදිතා, උපෙක්ඛා යන මෙම සද් ගුණ සමාජගත මිනිස් සිතිවිලි හා චර්යාවන්හි ප්‍රකට වන ගිජු බව, ආත්මාර්ථය, ඊර්ෂ්‍යාව, ද්වේෂය ආදී ප්‍රතිෂේධාත්මක මානසික ලක්ෂණයන්ට ප්‍රතිවිරුද්ධ වේ (Premasiri, 1987). එමෙන් ම සමාජගත සම්බන්ධතා පවත්වාගෙන යාමේ දී මිනිසුන් අතර උද්ගතවන ප්‍රති විරෝධතා දුරලීමටත් ගැටුම් සහිත වාතාවරණයන් ඉවත්කොට සමගිය ඇතිකරලීමටත් ජීවන පැවැත්මේ දී ඇතිවන විවිධ මානසික අසමතුලිතතා සමතුලිත කිරීමටත් සමාජගත ව මතුවන බාධක දුරුකිරීමටත් සුහදත්වය වර්ධනය කරන, ප්‍රීතිය හා බලාපොරොත්තු ජනිත කරවන සමාජ පරිසරයක් නිර්මාණය කිරීමටත් සතර බ්‍රහ්ම විහාර සංකල්පය භාවිත කළ හැකිවීම සුවිශේෂී ලක්ෂණයකි (Nayanponika). අධ්‍යාපනය පිළිබඳ බෞද්ධ සංකල්පයන්හි අභිප්‍රාය වන්නේ ද එය ම වේ.

මේ අනුව මෙත්තා, කරුණා, මුදිතා, උපෙක්ඛා නම් වූ සතර ගුණ ධර්ම වර්ධනය කරගැනීම යහපත් වූ සමාජ සදාචාරයක් නිර්මාණය කරලීමට බෙහෙවින් උපස්ථම්භක වන බව පැහැදිලි ය. සමස්ත මිනිස් සමාජය ම සදාචාරමය වශයෙන් සමාජානුයෝජනය

කරවීමේ අධ්‍යාපනික ස්වභාවය එම සද් ගුණයන්හි මූර්තිමත් වේ. මෙකී සද්ගුණයන් මානව චිත්ත සන්තානයෙහි වර්ධනය කරනු ලබන්නේ නම් සමස්ත සමාජ පර්යාය වඩාත් ප්‍රසන්න වේ. මිනිස් සිත්වන්නේ එම සද් ගුණයන් ඉවත්වනවා යනු සමස්ත සමාජ පර්යාය ම සදාචාරමය සමාජානුයෝජනයෙන් ඉවත් වීමකි.

## සමාලෝචනය

බුදුදහම සමාජයීය ස්වභාවය විෂය කරගත් දර්ශනයකි. එපමණින් පුද්ගලයාව සමාජමය සන්දර්භයක විශ්ලේෂණයට ලක් කෙරේ. සමස්ත සමාජය ම අර්ථවත් වන්නේ පුද්ගල සංයුතියෙනි. ඒ අනුව මානවයාට සමස්තය නියෝජනය වන සමාජමය සංදර්භයෙන් බැහැරව කටයුතු කිරීම අසීරු කාර්යයකි. සමාජානුයෝජන ක්‍රියාවලිය මගින් සිදුකෙරෙනුයේ අදාළ සමාජයට උචිත ආකාරයට හැඩගැසී කටයුතු කිරීම යි. බෞද්ධ දර්ශනය මෙම මානව සමාජානුයෝජනමය ක්‍රියාවලිය මැනවින් විශ්ලේෂණය කරන බව ත්‍රිපිටකාගත දේශනා වලින් විශද වේ. නූතන සමාජ විද්‍යාඥයන් විසින් සමාජානුයෝජනය පිළිබඳව දක්වන මතවාදයන්ට වඩා බෞද්ධ දර්ශනයෙන් ප්‍රකටවන සමාජානුයෝජන සංකල්ප අතිශයින් ප්‍රශස්ත බව අවසාන වශයෙන් සඳහන් කළ යුතුය.

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය


අභයසුන්දර, ප්‍රණීත්. (2003). *මානව සමාජගත පවුල් සංකල්ප.* ගොඩගේ ප්‍රකාශන.

අ.නි. 5. ව්‍යග්ඝපජ්ජ සූත්‍රය, බු.ජ.ත්‍රි.ග්‍ර.මා, පුනර් මුද්‍රණ. (2005). බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, දෙහිවල.

කොතලාවල, එල්සි. (1979). *පියාජේගේ මනෝ විද්‍යා න්‍යාය.* ලේක්හවුස්, කොළඹ.

ඛු.නි. ධම්මපදපාළි. දණ්ඩ වග්ග, පණ්ඩිත වග්ග. බු.ජ.ත්‍රි.ග්‍ර.මා, පුනර් මුද්‍රණ. (2005). බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, දෙහිවල.

දී.නි. 1, සාමඤ්ඤඵල සූත්තං. බු.ජ.ත්‍රි.ග්‍ර.මා, පුනර් මුද්‍රණ. (2005). බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, දෙහිවල.

දී.නි. 3. සංගීති සුත්තං, සිගාලක සුත්තං. බු.ජ.ත්‍රි.ග්‍ර.මා, පුනර් මුද්‍රණ. (2005). බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, දෙහිවල.

ධම්මානන්ද හිමි, හෝමාගම. (2004). *බෞද්ධ හා කාන්ටියානු සදාචාර දර්ශනය.* එස්. ගොඩගේ ප්‍රකාශන.

ධර්මසිරි, ගුණපාල. (1988). *බෞද්ධ සදාචාරයේ මූලධර්ම.* සර්වෝදය ප්‍රකාශන.

පෙරේරා, ටෙනිසන්, බී. ඒ. (2002). *සමාජ විද්‍යාව.* තරංජි ප්‍රින්ටර්ස්, මහරගම.

ප්‍රේමසිරි, පී.ඩී. (1992). *බෞද්ධ ආචාර ධර්ම.* බුද්ධ ශාසන අමාත්‍යාංශයේ බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුවේ ප්‍රකාශන.

ම.නි. 1. සාලෙය්‍යක සුත්තං, කකචූපම සුත්තං. බු.ජ.ත්‍රි.ග්‍ර.මා, පුනර් මුද්‍රණ. (2005). බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, දෙහිවල.

ම.නි. 3. චූළකම්ම විභංග සුතතං. බු.ජ.ත්‍රි.ග්‍ර.මා, පුනර් මුද්‍රණ. (2005). බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, දෙහිවල.

රත්නපාල, නන්දසේන. (2001). *මානව විද්‍යාව.* ආරිය ප්‍රකාශන, වරකාපොල.

ස.නි. 5-2. වෙළුද්වාරෙය්‍ය සුත්තං. බු.ජ.ත්‍රි.ග්‍ර.මා, පුනර් මුද්‍රණ. (2005). බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, දෙහිවල.

*සිංහල විශුද්ධි මාර්ගය* (1959). ධර්මවංශ සංස්කරණය.

සෙනවිරත්න, අනුරාධ (1971). *සංස්කෘතිය හා සමාජය.* ලේක්හවුස්, කොළඹ.

සු.නි. මංගල සුත්තං, පරාභව සුත්තං, වසල සුත්තං, ධමමික සුත්තං. බු.ජ.ත්‍රි.ග්‍ර.මා, පුනර් මුද්‍රණ. (2005). බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, දෙහිවල.

හෙට්ටිආරච්චි, ධර්මසේන. (2001). *බෞද්ධ සමාජ විද්‍යා ප්‍රවේශය.* ගොඩගේ ප්‍රකාශන.

හේරත්, එච්.එම්.ඩී.ආර්. (1999). *ඥාතිත්වය.* කර්තෘ ප්‍රකාශන.

හේරත්, එච්.එම්.ඩී.ආර්. (2001). *ස්වභාවික පර්යායය, සංස්කෘතික පර්යායය හා පංචසීලය.* ප්‍රබුද්ධ 2 කලාපය.

හේරත්. එම්.එම්.ඩී.ආර්. (2001). *උතුරු මැද පළාතේ ශාක පිළිබඳ දේශීය වර්ගීකරණය. මානව උද්භිද විද්‍යාත්මක අධ්‍යයනයක්.* අප්‍රකාශිත දර්ශනශූරී නිබන්ධනය; පේරාදෙණිය වි. වි.

Bottomore. (1978). *Sociology*. Blackie Son Publishers, Bombay.

Chinoy, Ely. (1962). *Society, An Introduction to Sociology*. Random House.

Gnanarama, Pategama. (1996). *An Approach to Buddhist Social Philosophy. Tisarana Buddhist Association*, Singapore. Nayanponika. The Four Sub him eStates. B.P.S. Kandy.

Premasiri, P.D. (1987). *Buddhist Views on the moral qualities necessary for a social worker*. in Proceedings of the 13th International Buddhist Conference.

Ratnapala, Nandasena. (1993). *Buddhist Sociology*. Sri Satgura Publications; Delhi. Tylor, E.B. (1971). Prinictive Culture.

White, Leslie. (1949). *A Search of Cultures, A study of Man & Civilization*. New York.